2022.08.05

**සියලුම විභාග අපේක්ෂකයන් වෙත**

**<u>ප්‍රාථමික ශිල්පීය නොවන/ ප්‍රාථමික ශිල්පීය/ ප්‍රාථමික අර්ධ ශිල්පීය යන සේවාවන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම (වාචික පරීක්ෂණය) - 2022(01)</u>**

මෙම පරීක්ෂණය 2022 අගෝස්තු මස සිට සැප්තැම්බර් මස දක්වා අදියර කිහිපයකින් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ඒ අනුව පළමු අදියර ලෙස බස්නාහිර පළාත තුළ සේවය කරන අයදුම්කරුවන් අතරින් අයදුම්පත් යොමු කළ අනුපිළිවෙල අනුව තෝරාගත් අයදුම්කරුවන් පිරිසක් සඳහා 2022 අගෝස්තු 12වන දින අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රයේ දී මෙම කඩඉම් පරීක්ෂණය පැවැත්වේ. ඒ එදිනට සහභාගි විය යුතු අයදුම්කරුවන්ගේ නාම ලේඛනය මේ වනවිට අදාළ සේවා ස්ථාන වෙත තැපැල් මඟින් ද යොමු කර ඇත.

පරීක්ෂණයට අයදුම් කර ඇති අනෙකුත් අයදුම්කරුවන් සඳහා මෙම පරීක්ෂණය පැවැත්වෙන දිනයන් අදාළ ආයතන වෙත දැනුම් දෙන අතර ඉදිරියේ දී www.moe.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ප්‍රදර්ශනය කරනු ලබන බව කාරුණිකව දන්වමි.

කේ.ඒ.ඒ.ඉන්ද්‍රරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඒකාබද්ධ සේවා නොවන)
ලේකම් වෙනුවට

2022.08.05 14:29

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112784846
isurupaya@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/05/67/28/06 (II වෙළුම) ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2022.08. 04

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/ විදුහල්පතිවරුන් /

පීඨාධිපතිවරුන්/ ගුරු විදුහල්පතිවරුන්/

ගුරුමධ්‍යස්ථාන කළමනාකාරවරුන්

<u>(ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ (PL-I) සහ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ (PL-2) සහ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ (PL3)) කාර්යක්ෂමතා කඩඉම .......2022(I) සඳහා කැඳවීම් ලිපිය</u>

ඔබ විද්‍යාලයේ/පීඨයේ/ගුරු මධ්‍යස්ථානයේ/ගුරු විද්‍යාලයේ සේවය කරන ඇමුණුම 1හි නම් දක්වා ඇති සේවක මහත්ම මහත්මීන් විසින් උක්ත විභාගය සඳහා යොමු කරන ලද අයදුම්පත් අනුව 2022.08.12 දින අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රයේදී පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පෙනී සිටින ලෙස ඔවුන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි.

02. ඒ අනුව ඇමුණුම 1හි දක්වා ඇති සියළුම ඉල්ලුම්කරුවන් තම නම ඉදිරියෙන් දක්වා ඇති සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය අනුව අදාල කාල පරිච්ඡේදය තුළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් විය යුතු අතර, මෙම විභාගය පැවැත්වෙන කාලසටහන පිළිබඳව අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය ඔස්සේද ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

03. තවද නියමිත දිනට විභාගයට පෙනී සිටීම අනිවාර්ය වන බවත් විභාගයට පෙනී සිටින අවස්ථාවේදී සියළුම අයදුම්කරුවන් විසින් පරීක්ෂණ මණ්ඩලය වෙත පහත දක්වා ඇති ලිපි ලේඛන ඉදිරිපත් කිරීමටද අනිවාර්ය වන බවත් සියළුම විභාග අයදුම්කරුවන් වෙත දැනුම් දීමටද කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි,

1. පත්වීම් ලිපිය/ ලිපි වල මුල් පිටපත් හෝ සහතික කල පිටපත්
2. අන්තර්ග්‍රහණ ලිපියක් නිකුත්කර ඇත්නම් එහි මුල් පිටපත හෝ සහතික කල පිටපතක්
3. ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ගුවන් ගමන් බලපත්‍රය
4. උසස්වීම් ලබා ඇත්නම් එම ලිපිවල මුල් පිටපත් හෝ සහතික කරන ලද පිටපත්
5. අවසන් වරට සමත්ව ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල ලේඛනයේ මුල් පිටපත හෝ සහතික කරන ලද පිටපතක්

ආර්.බී. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යන හා ඒකාබද්ධ සේවා)

2022.08.05 15:01


ගුරු අධ්‍යාපන ... } +94112784832 | +94112784825
ලේකම් / செயலாளர் } +94112784811 | +94112785162